**රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ මුළු හිමිකම් සහ වගකීම් ඉක්මවා මුළු වත්කම් රු.11,319,414 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ මුළු ලැබීම් රු.14,000,000 ක් සහ වර්ෂය තුළ මුළු ගෙවීම් රු.14,730,009 ක් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඉදිකිරීම් කර්මාන්ත 03 ක ණයහිමි ශේෂ නිවැරදි කිරීම සඳහා රු.3,562,813 ක් සමුච්චිත අරමුදල් ගිණුමට බැර කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.1,978,839 ක හර ශේෂයක් වශයෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී බිල්කළ කඩ කුලී ආදායම රු.1,186,200 ක් වුවද, රු.1,133,212 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ සේවක ඇප ආයෝජන ගිණුම රු.46,005 ක් වුවද, සේවක ඇප තැන්පතු ගිණුම රු.1,500 ක් ගිණුම්වල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව. | -එම- |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 25 ක රු.41,543,819 ක් වූ ශේෂ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, ලෙජර් ගිණුම්, උපලේඛන සහ ප්‍රා.ස 07 අනුව ශේෂයන් සමඟ නොසැසඳුනි. | නිවැරදි ගැලපීම් සිදුකර නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙළ කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 2,949,000 ක තොග ශේෂය සනාථ කිරීම සඳහා භෞතික පැවැත්ම විධිමත්ව හඳුනා නොගැනීම සහ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | අඩුපාඩු නිවැරදි කිරීමට උපදෙස් ලබා දුන් බව. | තොග සමීක්ෂණය සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 23 සහ 24 (1) අ,ආ වගන්ති | සභාවට අයත් මංමාවත් ස්ථිර සළකුණු සහ සීමා ලකුණු කර සැලසුම් පිළියෙල කර එම මංමාවත් සහ පටු මාවත්වල නාමලේඛනයක් දක්වමින් නියෝග වල නියම කර ඇති ආකාරයට දැන්වීම් පළ කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග සිතියම් ගත කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර, ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කරන බව. | පනතේ වගන්ති අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ පනතේ 2 ඡේදය | සභිකයින් 19 දෙනෙකු 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙස දැනුවත් කළද, ලබා දී නොමැති බව. | වාර්ෂිකව වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය 218 රීතිය | සමාලෝචිත වර්ෂය සඳහා සියළු ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂණ මණ්ඩලයක් මගින් පරීක්ෂා කරවීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නැත. | වාර්ෂිකව වත්කම් සමීක්ෂණය කර වාර්තා ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | වර්ෂ 05 කට වරක් බදු කුලී තක්සේරු කර ගිවිසුම්ගත වී සභාවේ ආදායම වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වුවද, සභාව සතු කඩ කාමර 51 ක් එලෙස තක්සේරුවක් නොකර 2015 වර්ෂයේ ලබාගත් තක්සේරු වටිනාකම් මත බදු කුලී අය කරමින් පැවතුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇතත්, තක්සේරු වාර්තා ලබා දී නොමැති බව. | නව තක්සේරු වාර්තා අනුව ගිවිසුම් වලට එළඹිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,827,035 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,249,369 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්ත මේන්තු ගත ආදායම රු. | බිල්කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තු ගත ආදායම රු. | බිල්කළ ආදායම රු. | රැස්කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් බදු | 1,842,000 | 1,397,323 | 909,532 | 487,791 | 2,599,700 | 2,260,776 | 1,238,400 | 1,022,376 |
| (ii) | කුලී | 6,002,000 | 3,690,659 | 5,470,627 | - | 6,062,000 | 4,591,550 | 4,720,440 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 902,500 | 902,500 | 820,500 | 82,000 | 850,600 | 850,600 | 674,550 | 176,050 |
| (iv) | වෙනත් ආදායම් | 2,160,000 | 3,955,814 | 4,881,854 | - | 6,986,100 | 4,441,648 | 7,939,479 | - |
| | එකතුව | 10,906,500 | 9,946,296 | 12,082,513 | 569,791 | 16,498,400 | 12,144,574 | 14,572,869 | 1,198,426 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයට අදාළව බදුදී තිබුණු සභාව සතු සති පොළවල් 03 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලිය රු.1,300,517 ක් 2023 පෙබරවාරි 02 දින දක්වාම අය කරගෙන නොතිබුණි. | ඇප තැන්පත් මුදල් වලින් හිලවු කිරීමට කටයුතු කරන බව. | හිඟ හිටි ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 03 වගන්තිය අනුව ප්‍රාදේශීය සභාවල කර්තව්‍යන් අතර ප්‍රදේශය ඇතුළත ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභසාධනය සහ සියළු පහසුකම් ආරක්ෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට කටයුතු සම්පාදනය කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී මහජන පුස්තකාලය සඳහා පොත් මිලදී ගැනීමට වාර්ෂික අයවැය ලේඛනයෙන් රු.200,000 ක මුදලක් වෙන්කර තිබුණද, රු.700 ක පොත් පමණක් මිලදී ගෙන තිබුණි. එය අයවැයෙන් වෙන්කළ මුදලේ ප්‍රතිශතයක් වශයෙන් ගත්විට සියයට 01 කටත් අඩු ප්‍රතිශතයක් විය. | රටේ පැවති අයහපත් ආර්ථික තත්වය හේතුවෙන් ආදායම් අඩු වීම නිසා වියදම් දැරීමට අපහසු වූ බව. | මහජනතාවගේ සුභසාධන සේවා පුළුල් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට ඖෂධ මිලදී ගැනීම සඳහා සභා අරමුදලින් ප්‍රතිපාදන සලසා නොතිබූ අතර, ආයුර්වේද මධ්‍යස්ථානයෙන් ලබාදී තිබුණු රු.200,227 ක ඖෂධ වලින් පමණක් රෝගීන් 1150 ක් සඳහා සේවය ලබාදී තිබුණි. එමෙන්ම බෙහෙත් ශාලාවට ඖෂධ 14 ක හිඟයක් හඳුනාගෙන තිබුණද හිඟ ඖෂධ ලබාදීමට සභාව කටයුතු කර නොතිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂිකව ඖෂධ සපයන අතර, ඒවා ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී සභා අරමුදලින් මිලදී ගැනීම සිදු කරන බව. | -එම- |

**3.2 කළමණාකරන අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 සහ 2015 වර්ෂ වලදී මාර්ග ඉදිකිරීම් කර්මාන්ත 13 ක් වෙනුවෙන් ගෙවා තිබුණු රු.481,487 ක අත්තිකාරම්, 2023 පෙබරවාරි 02 දිනට වසර 08 ක් ගතවී තිබුණද, පියවාගෙන නොතිබුණි. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කපා හැරීමට අවශ්‍ය කටුයුතු සිදු කරන බව. | අත්තිකාරම් මුදල් කඩිනමින් පියවා ගත යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ නාගදීපය ගොවිජන සේවා මධ්‍යස්ථානය යන රාජ්‍ය ආයතන වලින් සභාවට පවරාගෙන තිබුණු අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවති ලොරි රථයක්, ට්‍රැක්ටරයක් සහ යතුරුපැදි 03 ක් අලුත්වැඩියාව සඳහා යොමු නොකර සහා පරිශ්‍රයේ ගාල් කර තිබුණි. | කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස විෂය භාර නිලධාරියාට උපදෙස් ලබා දී ඇති බව. | අදාළ වාහන හා යතුරුපැදි අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 28 දින දක්වා සභාවට අයත් බැකෝ යන්ත්‍රයට යන්ත්‍ර පැය 280.6 ක් සේවයේ යොදවා එහි අලුත්වැඩියා කටයුතු සඳහා රු.1,562,151 ක් වැය කර තිබුණු අතර, බැකෝ යන්ත්‍රය කුලියට දීමෙන් රු.589,180 ක ආදායමක් උපයා තිබුණි. සභාව විසින් සභා බල ප්‍රදේශයේ ජනතාවගේ සුභසාධනය සඳහා සභාව සතු බැකෝ යන්ත්‍රය විවිධ කාර්යයන්හි යොදවා තිබුණු බව වාහන යෙදවීම් පිළිබඳ ලේඛනයේ දක්වා තිබුණද, බැකෝ යන්ත්‍රය සුභසාධන කටයුතු සඳහා යෙදවූ බවට කාර්මික නිලධාරීන් විසින් ඇස්තමේන්තු සකසා නොතිබුණි. | පොදු කටයුතු සඳහා බැකෝ යන්ත්‍ර යෙදවීම අත්‍යාවශ්‍ය වන අතර, එවැනි ඉල්ලීම් ලැබුණු පසු කාර්මික නිලධාරි ඇස්තමේන්තු සකස් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | බැකෝ යන්ත්‍රය කාර්යයන් වල යෙදවීමේදී ඇස්තමේන්තු සහ ලිඛිත සාක්ෂි තබා ගත යුතුය. |

### 3.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති ලැබිය යුතු ජල ගාස්තු රු.4,509,616 ක් සහ කඩ කාමර කුලී ආදායම් රු.71,519 ක් විධිමත් අනුමැතියකින් තොරව ගිණුම් වලින් කපා හැර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |